# පිරිසිදු ශක්තිය

## වෙත වූ මංපෙත්

Allan Drummond

අපේ බලශක්තිය අප එය ලබා ගන්නා ආකාරය සහ එය භාවිත කෙරෙන ආකාරය පිළිබඳ ව ලොව පුරා විස්මිත දේ සිදු වෙමින් පවතී. මෙම දැවැන්ත වෙනස්කම් සිදුවන්නේ කුමක් නිසා ද යන්න සහ පිරිසිදු බලශක්තිය වෙත වූ ගෝලීය සංක්‍රාන්තියේ දී කිසිවකු අත් නොහළ යුත්තේ මන්ද යන්න මෙම පොත තුළින් සොයා බැලෙයි.

පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ අරමුදලිනි.

~~ISBN [illegible]~~


Please use Commonwealth logo only

The Commonwealth

~~CHOGM SAMOA 2024~~ Commonwealth Heads of ~~Government Meeting~~ 21–26 October 2024 thecommonwealth.org/chogm

~~One Resilient Common Future: Transforming our Common Wealth~~

මෙම ප්‍රකාශන ද ලබා ගත හැකි ය





බලශක්තිය සහ මා
Allan Drummond




අප අවට ඇති බලශක්තිය
Allan Drummond

# පිරිසිදු බලශක්තිය

## වෙත වූ මං පෙත්



Allan Drummond




පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ
Alache Fisho, Victor Kitange, Sherry Dixon
ඔබේ නිර්මාණාත්මක දිරි ගැන්වීම සහ මග පෙන්වීම් සඳහා ස්තුති යි.
ඇන්ග්ලියා රස්කින් විශ්ව විද්‍යාලයේ ගෝලීය ස්ථායීකරණ ආයතනයේ
ආචාර්ය ඇලඩ් ජෝන්ස්, ඔබේ ද අදහස් සහ යෝජනා සඳහා ස්තුති යි.

පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය @2021
විස්තර සහ පෙළ - Allan Drummond
චිත්‍ර නිර්මාණ - Keith Drummond
නිර්මාණ සහකාර - Olivia Daw

මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ප්‍රකාශකයාගේ අවසරයකින් තොර ව, පිටපත් කිරීම, ශබ්ද පටිගත කිරීම යනාදිය ඇතුළු ව, ප්‍රතිනිෂ්පාදනය කිරීම, නැවත ලබා ගැනීමේ පද්ධතියක ගබඩා කිරීම හෝ ඕනෑම ආකාරයකින් හෝ විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රමයෙකින් සම්ප්‍රේෂණය නොකළ යුතු ය.
පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ අරමුදලිනි.

ISBN 9781849292023

The Commonwealth

## කර්තෘගේ සටහන

අපේ බලශක්තිය, එය අපට ලැබෙන ආකාරය සහ අප එය භාවිත කරන ආකාරය යන මේවා අප දිවි ගෙවන ආකාරය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. එය සැමවිට ම සිදු වී ඇත. අලුතින් එළි දකින නව බලශක්ති පද්ධති ජනතාවගේ ජීවිතවලට කෙසේ බලපාන්නේ ද යන්න සහ ලොව පුරා  සැම දෙනාට ම මෙම බලශක්ති සංක්‍රාන්තිය නිසා ඇතිවන අවස්ථා පිළිබඳ පුළුල් චිත්‍රය පිළිබඳ ව සලකා බැලීම වෙන කවරදාටත් වඩා අද ගුරුභවතුන්හට මෙන් ම සිසුන්හට ද ඉතා වැදගත් වේ. අප අවට දැවැන්ත ඉදිරි ගමනක් සිදු වෙමින් පවතී. සැමට සමාන ලෙස ප්‍රතිලාභ ලබා දීමේ විභවයක් එය සතු වේ.

මම ලොව වටා රටවල් කිහිපයකට ගොස් ඇති අතර, තිරසාරභාවය සහ පිරිසිදු ශක්තිය වෙත සංක්‍රාන්තිය වීම පිළිබඳ ව බොහෝ පැති ගැන සිසුන් කරුණු හදාරන පාසල්වලට ද ගොස් ඇත්තෙමි. සිසුන් දැනටමත් මෙම විෂය ගැන දන්නා ප්‍රමාණය පිළිබඳ ව ඇසීමේ දී මම සැමවිට ම පාහේ විස්මයට පත් වීමි.

මෙම පොත සඳහා මම මගේ සංචාර වලින් ලත් පෞද්ගලික අත්දැකීම් තුළින් වර්ධනය කරගන්නා ලද සිද්ධි දාම කිහිපයක් පිළිබඳ ව සිතා බැලුවෙමි. මගේ අරමුණ වන්නේ පිරිසිදු ශක්තිය වෙත සංක්‍රාන්තියේ දී සිසුන්ට හා ගුරුභවතුන්ට ඒ සඳහා ඉටු කළ හැකි කාර්ය භාරය පිළිබඳ ව උනන්දු කරවීම හා ඒ පිළිබඳ ව සංවාදයක් ආරම්භ කිරීම යි.

## ප්‍රකාශකගේ සටහන

මෙම පොත පොදු රාජ්‍ය මණ්ඩලීය තිරසාර බලශක්ති සංක්‍රාන්ති වැඩ පිළිවෙල යටතේ ප්‍රකාශිත යි. මෙම වැඩපිළිවෙළ අඩු කාබන් බලශක්ති පද්ධති වෙත සංක්‍රමණය වීම වේගවත් කිරීමට සහ හත්වැනි තිරසාර සංවර්ධන අරමුණ (SDG7) සාධනය කර ගැනීම උදෙසා පොදුරාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් අතර සහයෝගිත්වය සඳහා වන වේදිකාවකි. දරුවන් සහ තරුණයින් තිරසාර සහභාගීත්ව සංවර්ධනයේ කේන්ද්‍රයෙහි තබා ගනිමින්, ඔවුන් වෙත ආයෝජනය කිරීමට,  සියයට හැටකට වැඩි වූ අවුරුදු 30ට අඩු පොදු රජ්‍ය මණ්ඩල ජනගහනය සමග පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය කැප වී සිටී යි. පොදු රාජ්‍ය මණ්ඩලය පුරා සිටින පාසල් වියේ දරුවන් අතර බලශක්ති සාක්ෂරතාව සහ නවෝත්පාදනය වැඩිදියුණු කිරීම සඳහා වූ මෙම උද්යෝගිමත් මුල් පියවර පිළිබද වැඩි දුර කරුණු සොයා ගැනීම සඳහා කරුණාකර Sustainableenergy@ commonwealt.int සබැඳිය භාවිත කරන්න.





සූර්ය ශක්තිය එක්රැස් කර ගැනීම සඳහා විශාල දර්පණ භාවිත කරන සූර්ය බලාගාරයක්






අප්‍රිකාවේ සහරා කාන්තාරය ආසන්නයේ පිහිටා ඇති විශාල සූර්ය බලාගාරයක් අසලින් පාසලට යන සිසුන්

Photographs: Allan Drummond






# පිරිසිදු බලශක්තිය

## වෙත වූ මං පෙත්

Allan Drummond

ලොව
**සැම තැන ම**
දරුවන් පාසල් යනවා



සමහරු පයින් යනවා



සමහරු පා පැදියෙන් යනවා



තවත් අය බෝට්ටුවෙන් යනවා





## ඔබට ප්‍රශ්න කිහිපයක්

ඉහතින් දැක් වූ වෙනස්කම්වලින් කිසිවක් ඔබ අසල සිදුවේ ද?

එම වෙනස්කම් ඔබට බලපානු ඇත්තේ කෙසේ ද?

පොසිල ඉන්ධන දහනයේ කිසියම් ප්‍රතිඵලයක් ඔබ දකිනවා ද?

ඔබේ පවුලේ අය වායු වර්ග ඇතුළු ව කුමන අපද්‍රව්‍ය නිපදවනවා ද?

එම අපද්‍රව්‍යවලට සිදුවන්නේ කුමක් ද?

ඔබට බලශක්තිය ඉතිරි කර ගත හැක්කේ කෙසේ ද?

ඔබේ අසල්වැසි සැම දෙනාට ම විදුලිය තිබෙනවා ද?


ඔබේ පවුලේ අය බලශක්තිය සඳහා කොපමණ මුදලක් වැය කරනවා ද?

ඔබේ ප්‍රදේශයේ වෙනස් විය හැකි දේවල් මොනවා ද?


බලශක්ති ස්වාධීනත්වය යනු කුමක් ද?

බලශක්ති ස්වාධීනත්වය මගින් ලැබිය හැකි වැඩිපුර ප්‍රතිලාභ මොනවා ද?

**පිරිසිදු බලශක්තිය ලබා ගැනීම සඳහා බොහෝ මාර්ග තිබෙනවා.
ඔබ තෝරා ගන්නේ කුමන මාර්ගය ද?**






## සියල්ලෝ ම එක ම කණ්ඩායමේ! වෙනස ඇත්තේ මෙ තැන යි

සුළං ටර්බයිනයක පෙති කරකැවෙනවා හෝ වහලයක් මත සූර්ය පැනලයක් දිදුලමින් තිබෙනවා ඔබ කවදා හෝ දැක තිබෙනවා ද? මේවා ක්‍රියා කරන ආකාරය පිළිබඳ ව සමහර විට ඔබ සුළු වශයෙන් හෝ දන්නවා ඇත; ඒවා ක්‍රියා කරන ආකාරය එනම්, විදුලිය නිපදවීම සඳහා සුළඟින් සහ හිරු එළියෙන් ඒවා ශක්තිය උකහා ගන්නා ආකාරය පිළිබඳ ව.

මේවා මුළු ලෝකයේ ම සිදු වන දැවැන්ත වෙනසක කොටසක් පමණ යි. ඛනිජ තෙල්, ගල් අඟුරු සහ ඉන්ධන වායු වැනි සාම්ප්‍රදායික ශක්ති ප්‍රභවවල සිට පිරිසිදු ශක්ති ප්‍රභව වෙත ලෝකය ගමන් කරමින් සිටිනවා. අපේ ලෝකය බෙහෙවින් අන්තර් සම්බන්ධිත යි. එ බැවින් අපේ රටවල බලශක්ති උත්පාදනය කරන හා ඒවා භාවිත කරන පිළිවෙලෙහි සිදු කෙරෙන වෙනස්කම් ගෝලීය වශයෙන් අනෙක් රටවලට ද බලපෑම් ඇති කරනවා.

ඒ නිසා ලොව පුරා සිටින සැම දෙනාට ම සාධාරණ ලෙස වෙනස සිදුවන බව සහතික කිරීමටත්, එම වෙනස මගින් ලබා දිය හැකි ප්‍රබෝධ ජනක අවස්ථාවලින් සැවෝ ම ප්‍රතිලාභ ලබන බව සහතික කිරීමටත් අප සැම එක් ව වැඩ කළ යුතු වෙනවා.

මෙම පොත තිරසාර පිරිසිදු ශක්තිය 'දිගුකල් පවත්නා හානිදායක නොවන ජවය' ගෝලීය ව සංක්‍රාන්ති වීම (ලෝක ව්‍යාප්ත ව සංක්‍රමණය වීම) පිළිබඳ ව වූ පොත් තුනකින් එකකි.

මෙම වෙනස සිදු වන්නේ මක්නිසා ද යන්නත්, බලශක්තිය කරා යන ගමන සියලු දෙනා උදෙසා ය යන්නත් මෙම පොත මගින් සලකා බලන්නෙමු.

## නව ගමනක්!

පිරිසිදු බලශක්තිය අපේ බලශක්තිය ලෙස වැළඳ ගැනීමේ දී අප ජීවත් වෙමින් සිටින්නේ උද්වේගකර කාල වකවානුවක යි. එහෙත් ගෝලීය බලශක්ති සංක්‍රාන්තිය සිදු වෙමින් පවතින්නේ කුමක් හෙයින් ද?

ඊට හේතු රාශියක් තිබෙනවා. ඉන් එක් හේතුවක් වන්නේ අප විසින් දීර්ඝ කාලයක් තිස්සේ භාවිත කරන ලද ගල් අඟුරු, ඛනිජ තෙල් වැනි සාම්ප්‍රදායික ඉන්ධන යන මේවා ශක්ති ප්‍රභව ලෙස භාවිත කිරීම වඩාත් දුෂ්කර වෙමින් පැවතීම යි. අප ඒවායේ අවසානය දක්වා භාවිත කරමින් සිටින අතර ඒවා නැවත ප්‍රතිස්ථාපනය කළ නොහැකි යි. එ බැවින් අපට වෙනත් ශක්ති ප්‍රභව සොයා ගැනීමට සිදු ව තිබෙනවා.

ඉහත කී ඒවා පොසිල ඉන්ධන ලෙස හැඳින්වෙනවා. ඒවා නිර්මාණය වී ඇත්තේ මියගිය පැලෑටි හා වෙනත් ජීවීන් වගුරු තුළ හෝ මුහුද යට තැන්පත් වී හෙමින් දිරාපත් වීමෙනු යි. මෙම කාබනික ද්‍රව්‍ය පොසිල ඉන්ධන බවට දිරාපත් වීම සඳහා අවුරුදු මිලියන ගණනක් ගත වෙනවා. මෙසේ නිර්මාණය වූ ඉන්ධන පොළොව හාරා නල මගින් මතුපිටට පොම්ප කර ගනු ලබනවා. අප මෙම ඉන්ධන භාවිත කරනු ලබන සීඝ්‍රතාවෙන් නව ඉන්ධන නැවත නිර්මාණය නොවන බැවින්, මෙම පොසිල ඉන්ධන පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව ලෙස හැඳින්වෙනවා.

පිරිසිදු බලශක්ති සංක්‍රාන්තියට තවත් ප්‍රබල හේතුවක් වන්නේ පොසිල ඉන්ධන දැවීමෙන් ලැබෙන්නේ පිරිසිදු ශක්තිය නොවීම යි. ඒවා දහනයේ දී පිටවන කාබන් ඩයොක්සයිඩ් ($CO_2$) නම් වූ වායුව පෘථිවි වායුගෝලයට සහ දේශගුණයට අහිතකර බලපෑම් ඇති කරනු ලබනවා.

මෙම වෙනස සිදු කිරීමට තවදුරටත් හේතු වන්නේ පොසිල ඉන්ධන දහනයෙන් සිදුවන වෙනත් දූෂණ අඩුකර ගැනීම සහ ස්වාභාවික ලෝකයට සිදුවන අහිතකර බලපෑම් අඩු කර ගැනීම යි. මෙ හිදී අතිශයින් ම වැදගත් වනුයේ අප වටා ඇති සියලු පුනර්ජනනීය බල ශක්තියෙන් සාධාරණ කොටසක් භාවිතා කිරීමට ජනතාව වෙත ලබාදීම යි.

අපට අවශ්‍යවන ශක්තිය නිපදවීම සඳහා භාවිත කරනු ලබන ඉන්ධන පද්ධති වෙනස් වෙමින් පවතිනවා.



අපට හුරු පුරුදු ඉන්ධන වන දර,



ගල් අඟුරු, ඛනිජ තෙල් සහ ඉන්ධන වායුවල සිට....





අනාගතයේ දී නව පිරිසිදු බලශක්ති පද්ධති සමග ලෝකයේ බොහෝ රටවලට ඔවුන්ගේ ම බලශක්තිය නිපදවා ගැනීමට හැකි වේවි. එවිට ඔවුන්ට වෙනත් රටවල් මත යැපීමට සිදු නොවනු ඇති. එ මගින් ඔවුන් බලශක්ති ස්වාධීනත්වය ලබා ගනීවි.
ඉන් මානසික නිදහස ද දසත පැතිරුණු සාමයේ අපේක්ෂාව ද ලැබෙනු ඇති.

ලෝකය වෙනස් වනු ඇත.




## ගමන සහ ගමනාන්තය

පිරිසිදු බලශක්තියට සංක්‍රාමණය වීම නිසා නිසැකව ම ලැබෙන ප්‍රතිලාභ සමහරක් පිළිබඳ ව අපට සමහරවිට සඳහන් කළ හැකි යි. බොහෝ දෙනා වටහා ගෙන සිටින්නේ මෙ මගින් ලෝකයේ පරිසර දූෂණය අඩු වන බවත්, ලෝකයේ දේශගුණය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති වේ යැයි බලාපොරොත්තු විය හැකි බවත් ය. අප විසින් පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභව අවසන් නොකරනු ඇත යන්න එමගින් අදහස් වෙනවා.

රටවල්, කලාප මෙන් ම ප්‍රාදේශීය ස්ථාන පවා විශාල වශයෙන් ඔවුන්ගේ ම බලශක්ති ජනනය කරනු ඇති. අපේ මෝටර් රථ සහ නිවාස පවා ශක්තිය එක් රැස් කිරීමේ සහ ගබඩා කිරීමේ ස්ථාන වනු ඇති.

අපට අවශ්‍ය ශක්තිය අපට ම ජනනය කර ගත හැකි බව දැන ගැනීමෙන්, එනම් බලශක්ති ස්වාධීනත්වය ලබා ගැනීමෙන් අපට අනාගත ප්‍රතිලාභ බොහොමයක් ලැබෙනු ඇති. බලශක්ති ස්වාධීනත්වය අපට සුරක්ෂිතතාව මෙන් ම මානසික සහනය ද ලබා දෙනවා. බොහෝ ප්‍රවීණයින් පවසන්නේ, ගෝලීය බලශක්ති සංක්‍රාන්තිය මගින්, ලෝකය යුද්ධ සහ ගැටුම් අඩු, වඩාත් සාමකාමී ස්ථානයක් බවට පත් වනු ඇති බවයි.

අපි එය අපේක්ෂා කරමු.









## අඛණ්ඩ ව, පුනර්ජනනීය ශක්තිය කරා

අතීතයේ සිට ලෝකයේ විශාල බලශක්ති භාවිතයේ වෙනස්වීම් සිදු වී තිබෙනවා. අප පොසිල ඉන්ධන සොයා ගැනීමට පෙර ශක්තිය ලබා ගැනීම සඳහා ජනයා බෙහෙවින් ශාකවල දැව සහ පැළෑටි දවා තිබෙනවා.

පුනර්ජනනීය ශක්තිය ලැබෙන්නේ කිසි දිනෙක නොසිඳෙන (අවසාන නොවන) ප්‍රභවවලිනි. නිදසුනක් ලෙස, සුළඟ යනු පුනර්ජනනීය ප්‍රභවයක්. මන්දයත්, සුළඟ නිරතුරුව ම හමන බැවිනි. සියලු වර්ගවල සුළං මෝල් තනා ඇත්තේ සුළගේ ශක්තිය හසුකර ගැනීම සඳහා යි.

බොහෝ ගංගා වර්ෂය පුරා ම ගලා යන බැවින් ඒවා පුනර්ජනනීය ශක්ති ප්‍රභව වෙනවා. ජනතාව වේලි, ජලය මගින් ක්‍රියා කරන මෝල් සහ ජලයේ ශක්තිය භාවිත කෙරෙන වෙනත් උපක්‍රම අවුරුදු දහස් ගණනක් තිස්සේ භාවිත කර තිබෙනවා.

සූර්ය බලශක්තිය බවට පරිවර්තනය කර ගත හැකි සූර්යාලෝකය පුනර්ජනනීය ශක්ති සම්පතකට තවත් නිදසුනක් වෙනවා. අස්වනු නෙළා ගත් පසු වියළී යන ඉපැනැලි, පැළෑටි සහ ශාක ද එක්රැස් කර ගත්විට ඒවා ද ජෛව ස්කන්ධ බවට පත්කර ගත හැකි තවත් එ වැනිම සම්පතක් වෙනවා. ඒවායේ බීජ මගින් නැවත පැළ ලබාගත හැකි යි.

අපේ ආහාර අපද්‍රව්‍යවලින් මෙන් ම අපේ වැසිකිළි අපද්‍රව්‍යවලින් පවා ශක්තිය ජනනය කළ හැකි ක්‍රම පිළිබඳ ව සොයා බැලීමට විද්‍යාඥයින් කටයුතු කරමින් සිටිනවා.

## එය සංකීර්ණ යි

නිදසුනක් ලෙස සමහර රටවල් පතල් කැනීම් මගින් ගල් අඟුරු ද, භූමි විදුම් මගින් ඛනිජ තෙල් හා ඉන්ධන වායු ද මහා පරිමාණයෙන් ලබා ගනිමින් ඒවා මත විශ්වාසය තබා ගෙන සිටිනවා. සුළු නගර, මහා නගර, ප්‍රජාවන් සහ ස්වදේශීය ජනතාව මෙම කර්මාන්ත මගින් ජනිත වන රැකියා සහ මුදල් මත නිරතුරුව ම යැපෙනවා. මේ සියලු රටවල් රඳා පවතින්නේ මෙම ඉන්ධන පිට රටවලට විකිණීමෙන් උපයා ගන්නා මුදල් මත යි.

ඒ බැවින් අපේක්ෂිත වෙනස මේ දක්වා එම රටවලට බොහෝ අභියෝගාත්මක සහ අවිනිශ්චිත බවක් පෙන්නුම් කර තිබෙනවා. ඔවුන්ට ඔවුන්ගේ එක ම බලශක්ති ප්‍රභවයෙන් ඉවත් වී පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වෙත මාරු වීමට ක්‍රම සොයා ගැනීමට සිදුවනු ඇති. නව රැකියා සපයා ගැනීමටත්, ඔවුනට සහ රටට අවශ්‍ය මුදල් උපයා ගැනීමටත් විවිධ මාර්ග සොයා ගැනීමට ඔවුනට සිදුවෙනවා.

ජනතාවට ඔවුන්ගේ පුරුදු, ඔවුන් ජීවත්වන ක්‍රමය මෙන් ම, ඔවුන් ජීවත්වන ස්ථාන පවා වෙනස් කිරීමට සිදුවන ඇති.

බොහෝ පුද්ගලයින්ගේ ජීවිතවල කඩාකප්පල් වීම් ද සිදුවනු ඇති. සංක්‍රාන්තිය හෙවත් වෙනස් වීම තුළට සැම දෙනා ම ඇතුළත් කර ගැනීමත්, සැමට එය සාධාරණ වන බවට වග බලා ගැනීමත් වැදගත් වන්නේ ඒ බැවිනි.

ජනතාවගේ නිවාස සහ රැකියා ස්ථාන වායුසමනය කෙරෙන ආකාරය මෙන් ම ඔවුන් වැඩ කරන ආකාරය සහ ඔවුන් ගමන් බිමන් යන ආකාරය වැනි දෑ කෙරෙහි ද මෙම වෙනස බලපානු ඇති.

ඔව්, වෙනස පැමිණෙමින් තිබෙනවා.

වෙනස්වීම, සංක්‍රාන්තිය ලෙස හැඳින්වෙනවා.
අප වඩාත් පිරිසිදු ඉන්ධනවලට මාරු වෙමින් සිටිනවා.
එයට හේතුව පැරණි ඉන්ධන භාවිතයෙන්
විවිධ ගැටලු මතු වීම යි. එනම්,




..... සහ පරිසරයට සිදු වන හානය යි.







**මූලයමය වශයෙන් දැරිය හැකි පිරිසිදු ශක්තිය සඳහා මෙම ඉලක්ක තබා ගෙන ඇත.**

# ජාහීන් වෙමු

ශක්ති කාර්යක්ෂමතා වර්ධනය දෙගුණ කිරීම

පිරිසිදු ශක්තිය සඳහා පර්යේෂණ, තාක්ෂණවේදය, සහ ආයෝජනය සඳහා වූ ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම.

සංවර්ධනය වන රටවල් සඳහා බලශක්ති සේවා පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම




## පිරිසිදු ශක්තිය අපට අපේ ම යැයි කිව හැකි යි

ගෝලීය ශක්ති සංක්‍රමණයේ අරමුණ වනුයේ ජනතාවට සහ පරිසරයට හානිකර අතුරුඵල ඇති නොකරන බලශක්ති උත්පාදන පද්ධති බිහි කර ගැනීම යි. බොහෝ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ඉතා පිරිසිදු ඒවා යි. ජෛව ස්කන්ධය (පිදුරු සහ දැව වැනි දැවිය හැකි ශාක ද්‍රව්‍ය) සහ ජීව වායුව (අපද්‍රව්‍ය භාවිතයෙන් නිපදවන දැවිය හැකි වායුව) ද දැවීමේ දී හානිකර අතුරුඵල පිට කරනවා. එහෙත් ගල් අඟුරු, ස්වභාවික වායුව හෝ සාමාන්‍යයෙන් ඉවතලන ද්‍රව්‍ය දැවීමේ දී පිට කරන අතුරුඵලවලට වඩා මෙම අතුරුඵල හානිදායකබවෙන් බෙහෙවින් අඩු යි.

පුනර්ජනනීය ශක්තිය යනු අනිවාර්යයෙන් ම තෝරා ගත යුතු මාර්ගය යි. ලෝකයේ සෑම රටක ම සහ කලාපයක ම පාහේ බහුල ව පුනර්ජනනීය ශක්තිය පවතිනවා. මේ සියල්ලෙන් ම අදහස් කෙරෙන්නේ ඔවුන්ට බලශක්ති ස්වාධීනත්වය වෙත ළඟාවීමට ඉලක්කයක් තබා ගත හැකි බව යි. මෙය ඔවුන්ට අවශ්‍ය ශක්තිය වෙනත් රටවලින් ලබා ගැනීම අවශ්‍ය නොවන තත්වය කි. ඉන් අදහස් වන්නේ ඔවුන් නිපදවන ශක්තිය කෙරෙහි ඔවුන්ගේ පාලනයක් ඇති බව යි. එසේ ම කාලයත් සමඟ බලශක්තිය වඩාත් ලාභදායක විය යුතු යි.

විශේෂඥයින්ගේ අදහස වනුයේ නව බලශක්ති පද්ධති නිසා සෑම රටකට ම පාහේ පුනර්ජනය බලශක්තියෙන් සන්නද්ධ වීමට හැකි වෙනු ඇති බව යි. අප සියලු දෙනා අවට බෙහෙවින් පුනර්ජනය බලශක්ති තිබෙනවා. අප සැමට පුනර්ජනීය ශක්තිය පමණක් භාවිත කරන ලෝකයක් කරා ළඟා විය හැකි නම්, ඉන් අපට මෙන් ම ලෝකයේ සිටින සියලු ම ජීවීන්ට බොහෝ ප්‍රතිලාභ අත් වනු ඇති.









පැරණි ඉන්ධන භාවිතය අපට තවත් ගැටළු ද නිර්මාණය කර තිබෙනවා. එනම්, සාම්ප්‍රදායික ඉන්ධන හෝ ඒවායින් නිපදවා ගනු ලබන ශක්තිය හෝ සෑම කෙනෙකුට ම පහසුවෙන් ලබා ගැනීමට හැකියාවක් නැහැ.



## යා යුත්තේ කුමන මාර්ගයේ ද ?

ශක්තිය නිපදවා ගැනීමේ දී සහ එම ශක්තිය ජනතාව වෙත ලබා දීමේ දී විවිධ වූ ක්‍රියාමාර්ග සොයා ගැනීම පිළිබඳ ව ජාතීන්, නගර, සුළු නගර සහ ප්‍රජාව දක්ෂතාවක් සහ උද්යෝගීමත්බවක් දැක්වීම අවශ්‍ය වෙනවා.

විවිධාංගීකරණය යන්නෙන් විවිධ රටවල විවිධ දේ අදහස් කරනු ලබනවා. නිදසුනක් ලෙස; සමහර රටවල් විදුලිය ජනනය කිරීම සඳහා ගල් අඟුරු භාවිතය වෙනුවට වෙනත් විවිධ ආකාර කිහිපයක මිශ්‍ර ක්‍රම වෙත නැඹුරු වෙමින් සිටිනු දැකි යි.

එහෙත් මෙ වැනි වෙනස් වීමක් සැබවින් ම ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි සිතා බලන්න.

ඒ සඳහා බොහෝ මුදල් සහ බොහෝ සැලසුම් කිරීම් අවශ්‍ය වනු ඇති. ජනතාවට නිවාස මාරු කිරීමට ද, නව ආකාරවලට වැඩ කිරීමෙන් නවීන ක්‍රම ඉගෙන ගැනීමට ද සිදු වනු ඇති.

මුලදී මෙම වෙනස් වීම් සියල්ල ජනතාවගේ ජීවිතවලට දුෂ්කර තත්වයක් ඇති කරන බව පෙනී යනවා. ඔවුන් වසර ගණනාවක සිට නිරත වූ රැකියා අතුරුදහන් වනු ඇති. සැබවින් ම මෙය ප්‍රජාවට සහ පුද්ගලයින්ට කරදරයක් විය හැකි යි. එහෙත් එය විසඳා ගත හැකි අභියෝගයක්! නිදසුනක් ලෙස නව පිරිසිදු බලශක්ති පද්ධති ප්‍රජාවට සහ පවුල්වලට නව රැකියා අවස්ථා නිර්මාණය කර දෙනු ඇති. එසේ ම ඔවුනට ආරක්ෂාකාරී බලශක්තිය ලැබීම සහතික කරනු ඇති.

තිරසාර පිරිසිදු බලශක්තියට සංක්‍රාන්ති වීම අවුල් සහගත තත්වයක් ඇති කිරීමට හේතු විය හැකි යි. පැරණි සාම්ප්‍රදායික ක්‍රමවලට වැඩ කිරීමේ සාම්ප්‍රදාය වෙනස් විය යුතු ව තිබෙනවා. කෙසේ වෙතත්, වෙනස්වීම දුෂ්කර විය හැකි වුව ද, එය ආකර්ෂණීය සහ ඵලදායී අවස්ථා රැසකින් ද සමන්විත විය හැකි යි. වෙනස් වීම දැනටමත් සිදුවෙමින් පවතිනවා. ඒ සඳහා විවිධ රටවල් විවිධ මාර්ග අනුගමනය කරමින් සිටිනවා!

ක්‍රියාමාර්ග .

පිරිසිදු බලශක්ති සංක්‍රාන්තිය දැනටමත් සිදු වෙමින් පවතිනවා. එක් එක් රටවල සහ ප්‍රාන්තවල එය විවිධ අයුරින් සිදු වෙනවා. මෙය අවුල් සහගත තත්වයක් ඇති වීමට හේතු විය හැකියි.




දිගින් දිගට ම විවිධ අංග එක් කර ගැනීමත් විවිධ ආකාරයේ නව පිරිසිදු බලශක්ති පද්ධති සමඟ වැඩ කිරීමටත් ප්‍රජාවනට සිදු වෙනු ඇති.






මගහැරීමට

කිසිවකු හෝ ~~අත්හැරීමට~~ ඉඩ නොතැබිය යුතු යි.



## අන්තර්කරණය, යුක්ති සහගතබව සහ සාධාරණත්වය

පිරිසිදු ශක්තිය සඳහා සිදු වන වෙනස් වීමේ දී අන්තර්කරණය (සියලු දෙනාගේ ම සහභාගිත්වය) අවශ්‍ය බවට ප්‍රාදේශීය මට්ටමේ සිට ලෝක මට්ටම දක්වා වූ අපගේ සියලු නායකයින් එකඟ වෙනවා. එය යුක්ති සහගත (අපක්ෂපාතී) විය යුතු මෙන් ම සාධාරණ ද (සැමට එක හා සමාන ව සැලකීම) විය යුතු වෙනවා.

මෙම වෙනස ලොව පුරා සිටින සෑම කෙනෙකුට ම සාධාරණ වනු ඇති බවට සහතික වීමට බොහෝ අය කටයුතු කරමින් සිටිනවා. මෙම කාර්ය සාධාරණ ලෙස සහ අපක්ෂපාතී ලෙස කළමනාකරණය නොකළ හොත්, ගෝලීය බලශක්ති සංක්‍රමණය නිසා සිදුවන වෙනස්කම් නිසා වඩා දුප්පත් ජනතාවගේ ජීවිත වඩාත් නරක අතට හැරීමට ඉඩ තිබෙනවා. ඇත්තෙන් ම එය විසඳිය යුතු ගැටලුවක් වෙනවා. එ බැවින් අරමුණ වන්නේ සෑම අයෙකුට ම බලශක්තිය සඳහා සමාන ප්‍රවේශයක් තිබිය යුතු ය යන්න යි.

සංක්‍රාන්තියේ දී කිසිවෙකු අත්හැරිය යුතු නැහැ.

අපට ශක්තිය ලැබෙන මාර්ග පිළිබඳ ව නව ආරකින් සිතීමට හා ඒ අනුව වැඩ කිරීමට හුරු වීමට අප උගත යුතු වෙනවා. අප භාවිත කරන ශක්තිය අපතේ නොයැවීමට අප සැම දෙනා ම සැලකිලිමත් විය යුතු වෙනවා.

**පිරිසිදු බල ශක්තිය වෙත**
**සංක්‍රමණය වීමේ දී යෙදෙන මූලික වදන්:-**




අන්තර්කරණය: සෑම දෙනා ම සහභාගී කර ගත යුතු ය.





එය සෑම දෙනාට ම අපක්ෂපාතී ලෙස සිදු විය යුතු ය.




සියලු ජනතාවට එක හා සමාන ව සැලකිය යුතු ය.



මෙතෙක් කල් වර්ෂ ගණනාවක් තිස්සේ ජනතාව දැන සිටියේ පැරණි ඉන්ධන වර්ග ගැන පමණ යි. බොහෝ ප්‍රජාවන් සහ නාගරික ජනතාව ඒවා මත විශ්වාසය තබා තිබෙනවා.




මෙම ජනතාව විවිධ වූ සහ සමහර විට දුෂ්කර තීරණ ගන්නට සිදු වේවි.

## සැවොම සඳහා වෙනස

වෙනස් වීම් සඳහා සියලු දෙනා සහභාගි කර ගැනීම පිළිබඳ ව සහතික වීම යන්නෙන් අදහස් කෙරෙන්නේ ප්‍රබෝධකර අවස්ථා සහ දැවැන්ත අභියෝගවලට මුහුණ දීම යි.

මෙම වෙනස්කම් සඳහා සියලු දෙනා එක් විය යුතු බව ජනාධිපතිවරුන්, අගමැතිවරුන්, ව්‍යාපාරික නායකයින්, විද්‍යාඥයින් සහ අධ්‍යාපනඥයින් වැනි ලෝක නායකයින් අවබෝධ කරගෙන සිටිනවා. ගෝලීය බලශක්ති සංක්‍රාමණය ඒකාන්තයෙන් ම වඩාත් දිළිඳු ජනතාවට උපකාර වන අවස්ථාවක් බවත්, අධ්‍යාපනය දියුණු කෙරෙන, නව පුහුණුවීම් හා හැකියා පිරිනැමෙන සහ නව රැකියා අවස්ථා උත්පාදනය කෙරෙන වෙනස් වීමක් බවත් ඔවුන් වටහාගෙන තිබෙනවා. එසේ ම, කිසිවකු අත් හැර නොදැමිය යුතු යි.


ගෝලීය බලශක්ති සංක්‍රාන්තිය සමඟ එක් ව එළඹෙන නව අවස්ථා පුරුෂයින්ට සහ ස්ත්‍රීන්ට සමාන ලෙස, අනෙක් අය තරම් හැකියාවෙන් යුක්ත නොවූ ජනතාවට ද පොහොසත් හා දුප්පත් රටවලට ද තරුණයින්ට හා වැඩිහිටියන්ට ද සමාන ලෙස ව්‍යාප්ත විය යුතු යි. එය පුද්ගලයකුගේ ජන වර්ගය, ආගමික විශ්වාස හෝ ස්ත්‍රී පුරුෂ භාවය මත රඳා නොපැවතිය යුතු ය යනු ලෝක ප්‍රයත්නයකි.

එය සෑම දෙනකුට ම විදුලිය ලබා ගැනීමට හැකි වන බව තහවුරු කිරීමට අවස්ථාවක් වෙනවා. ලෝකයේ මිලියන 860ක් ජනතාවට විදුලිය ලබා ගැනීමට හැකියාවක් නැහැ. මෙයට හේතුව සමහර විට ඔවුන් විදුලිබල ජාලයෙන් ඈත දුෂ්කර ප්‍රදේශවල ජීවත් වීම විය හැකි යි. එහෙත් බොහෝ විට එයට හේතුව විය හැක්කේ විදුලිය ඔවුනට ලබා ගැනීමට නොහැකි වන තරමට මිල අධික වීමයි.

ඒ බැවින් ජාතීන්ට සහ ජනතාවට රජයෙන් සහ බැංකුවලින් ආධාර උපකාර ලබා දීම අවශ්‍ය වෙනවා. ජනතාව විසින් සම්පත් බෙදා ගනු ලබන සහ එකිනෙකාට උපකාර කරගනු ලබන ප්‍රාදේශීය සංවර්ධන සමිති සහ කණ්ඩායම්වල කාර්ය භාරය වෙන කවරදාටත් වඩා මෙම කාර්යයේ දී වැදගත් වනු ඇත.


පිරිසිදු බලශක්ති සංක්‍රාන්තිය සෑම කෙනෙකුට ම ඉතා වාසිදායක අවස්ථා රාශියක් ගෙන ඒවි. ඉන් සමහරක් පෙනෙනු ඇත්තේ කුඩාවට යි.




කෙසේ වුවත්, ඔවුන් සියලු දෙනා මෙම සංක්‍රාන්තිය සාධාරණ බවට එකඟ වේවි. මේ මොහොතේ විදුලිය ලබා ගැනීමට හැකියාවක් නොමැති මිලියන ගණනාවක් වූ ලෝක ජනතාව වෙත විදුලිය ලබා දීමට හැකි වේ යයි අපේක්ෂා කෙරෙනවා. මන්ද, ඔවුනට ඒ සඳහා යන වියදම දරා ගත නොහැකි වීම නිසා හෝ විදුලි සැපයුම ඔවුන් වෙත ළඟාකර දීමට නොහැකි නිසා හෝ විය හැකියි.



සැමට විදුලි බලය ලැබුන විට ලෝකය කොයි වගේ වේ දැයි සිතා බලන්න.....